# වත් පිරීම

**ගරු කරතොට විමලරතන හිමි**

භික්ෂු සමාජය අනුක්‍රමයෙන් සංවර්ධනය වත්ම උපාධ්‍යාය සද්ධිවිහාරික ආචරිය අන්තෙවාසික යානාන්තරද ඔවුනොවුන් පිළිබඳ පැවතුම්ද පැහැදිලිකර දෙන්නට අවශ්‍ය විය. ඔවුනොවුන් පිළිබඳ හිතවත්කම විශ්වාසය පිතු–පුත්ත පෙම ආදි වචනයන්ගෙන් දක්වා ඇත. ඔවුනොවුන්ගේ අවශ්‍යතා වත් ඉටුවීම සඳහා වය්‍යාධර්ම රාශියක් දේශනා කළහ. උපජ්ඣාය වත්ත සද්ධිවිහාරික වත්ත ආචරිය වත්ත අන්තෙවාසික වත්ත වසයෙන් දැක්වෙන්නේ ඒ වය්‍යා ධර්ම සමූහයයි.

වත්ත නමින් දැක්වෙන මේවා නොසැලකීම නොකිරීම වරදක් ආපත්තියක් ලෙස දැක්වේ. ඔවුනොවුන්ගේ සමගි පැවැත්මටත් චාරිත්‍ර ධර්ම පූරණයටත් බාහිර ලෝකයාගේ ප්‍රසාදයටත් වය්‍යා ධර්ම විශේෂ උපකාරයකි. සමාජයක ක්‍රමවත් පැවැත්මට අවශ්‍ය දේ අනන්තය. හිතවත් කමත් ගෞරවාදරයත් වර්ධනයවන වය්‍යා ධර්ම ප්‍රධාන තැන ලා සැලකිය හැකිය. සද්ධිවිහාරිකයා කල් ඇතිව නැගිට ගෞරව සම්ප්‍රයුක්තව උපාධ්‍යායන් වහන්සේට දැහැටි පිළිගැන්විය යුතුය. දෛනික ජීවිතයේ අවශ්‍ය හැම දෙයක්ම ක්‍රමවත්ව කළ යුතුය. වාසය කරන ආරාමය හඳින පොරවන සිවුරු පිඩුසිඟා යන පාත්‍රය ආදියේ හැම වතක්ම නියමිත සේ කිරීම අවශ්‍යය. අනභිරති විනෝදනය, ආපත්ති පාරිසුද්ධිය කැප පිරිකර පරිවර්තනය වැනි හැම කාර්යයක්ම කළ යුත්තේ ගෞරවයෙනි. ගිලන් වූ විට කළ යුතු උපස්ථාන ආදියද නිසි පරිදි කළයුතු පිළිවෙළ දැක්වේ.

උපාධ්‍යායන් වහන්සේ ද සද්ධිවිහාරිකයාට උදෙසීම් ආදිය මෙන්ම අවශ්‍ය ඇවතුම් පැවතුම් කරුණාවෙන් කළ යුතුය. ගිලන් වූ විට ගිලනාට කළයුතු උපස්ථාන කළ යුතුය. ආචරිය අන්තෙවාසිකයන් අතරද මේ චර්යාධර්ම මැනවින් පැවතිය යුතු බව දක්වා ඇත්තේ භික්ෂු සමාජයේ අනාකූල පැවැත්ම පිණිසය. මෙහි දැක්වෙන වත්තං යන්න අර්ථකථනයකර ඇත්තේ චාරිත්තං යනුවෙනි. අර්ථ කථාචාර්‍ය බුද්ධඝෝෂපාදයෝ ''භගවතා ඉදං කත්තබ්බන්ති පඤ්ඤත්ත සික්ඛාපදපූරණං තං චාරිත්තං'' යි භාග්‍යවතුන් වහන්සේ මෙය කළයුතු යැයි පනවා වදාළ ශික්ෂා පද පූරණය චාරිත්ත සීලය වශයෙන් විවරණය කරති. වත්පිළිවෙත් පිරිම සීලයේම අඞගයකි. අභිසමාචාරය ශීලයේ කොටසක් වශයෙන් බෙදමින් ''අභිසමාචාරොති උත්තමසමාචාරො'' යි උත්තම හැසිරීමක් සේ විවරණය කෙරේ. විමති විනෝදනිය ''අභිවිසිට්ඨෝ උත්තමො සමාචාරො අභිසමාචාරො''යි පළමු කී අර්ථය තවත් තහවුරු කර ඇත. එහිම වත් පිළිවෙත් පිරීමෙන් සම්පූර්ණවන්නේ අභිසමාචාර ශීලය බව ප්‍රකට කෙරේ. අභිසමාචාරය පිණිස පනවා වදාළ මහාවග්ග චුල්ලවග්ග පරියාපන්න ඛන්ධක සික්ඛා සමූහය භික්ෂු ජීවිතය සකස් කරන ශික්ෂා සංග්‍රහය වේ. මේ අතර විශේෂ වශයෙන් වත්තක්ඛන්ධකයේ වදාළතාක් ශික්ෂා අභිසමාචාරය සේ දැක්වේ. ආගන්තුක, ආවාසික, පිණ්ඩචාරික ආදි තුදුසක් වත් වත්ත ක්ඛන්ධකයේ විස්තර වේ.

වත්තං න පරිපූරෙන්තෝ න සීලං පරිපූරති
අසුද්ධසීලො දුප්පඤ්ඤො චිත්තෙකග්ගං න වින්දති

වත් නොපුරන්නේ සිල් නොපුරයි. සිල් නැති නුවණ නැත්තා එක අරමුණක පවත්නා සිත නොලබයි. වත් නොපුරන්නාට සීලයත් සමාධියත් නොලැබෙන බව මෙයින් කියවේ.

වික්ඛිත්තචිත්තෝ නෙකග්ගො සද්ධම්මං න ච පස්සති
අපස්සමානො සද්ධම්මං දුක්ඛා න පරිමුඤ්චති

විසුරුනු සිත් ඇති එක අරමුණක් නැති පුද්ගලයා ධර්මය නොදකී. ධර්මය නොදකින්නා දුකින් නොමිදේ.

එත් පුරන තැනැත්තාට කෙලෙස් ඇති නොවේ. දෙඅසු කුඩාවත් තුදුස්මහවත් සැමළු බෝමළු පැන්හල් පෝගේ ආගන්තුක ගමික වත් පුරන්නාට කෙලෙස් ඇති වන්නට අවකාශ නැත.

චර්යාධර්මයන් වශයෙන් බුදුන් වහන්සේ අගය කර ඇති සංඝ සමාජයේ මනා පැවැත්මට බෙහෙවින් උපකාර වූ ශිලාදී ගුණ ධර්ම වර්ධනයට හිතකර වත්පිළිවෙත් පිරීම ශාසනයේ පැවැත්මටද බෙහෙවින් උපකාරී වෙයි.

---

ඔබේ වරද අනුන් පිට පටවා ඔබ නිර්දෝෂියකු
වෙන්න උත්සාහ ගන්නෝ ඇයි.

(මෝරා පංත)

---